1978 - 7 - 20

# ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 28 දරන ජාත්‍යන්තර මුදල් සංස්ථා ගිවිසුම් (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 1978 ජූලි මස 12 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

(1978 ජූලි මස 14 වැනි දින ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රයේ II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී)

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළ දී ලබාගත හැක

මිළ : ශත 15 යි. තැපැල් ගාස්තුව : ශත 15 යි.

# ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 28 දරන ජාත්‍යන්තර මුදල් සංස්ථා ගිවිසුම් (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 1978 ජූලි මස 12 වන දින]

එල්. ඩී.—ඕ. 29/78.

ජාත්‍යන්තර මුදල් සංස්ථා ගිවිසුම් පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.

ශ්‍රී ලංකා ජනරජයේ ජාතික රාජ්‍ය සභාව විසින් මෙසේ පනවනු ලැබේ :—

**1.** මේ පනත ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 28 දරන ජාත්‍යන්තර මුදල් සංස්ථා ගිවිසුම් (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. — ලුහුඬු නාමය.

**2.** ජාත්‍යන්තර මුදල් සංස්ථා ගිවිසුම් පනතේ 3 වන වගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් වගන්තිය මෙයින් ඇතුළත් කරනු ලබන අතර, එය ඒ පනතේ 3අ වන වගන්තිය ලෙස බලපැවැත්විය යුතු ය :— — 3අ වන අලුත් වගන්තිය 425 වන අධිකාරයෙයි ඇතුළත් කිරීම.

"දායක මුදල් වැඩි කිරීම.

3අ. ව්‍යවස්ථා මාලාවේ II වන ව්‍යවස්ථාවේ 2 වන වගන්තියේ (ඇ) ඡේදයේ (ii) වන අනුඡේදය අනුව සංස්ථාවේ අනුමත ප්‍රාග්ධන ස්කන්ධය වැඩි කරනු ලබන්නා වූ ද, ව්‍යවස්ථා මාලාවේ II වන ව්‍යවස්ථාවේ 2 වන වගන්තියේ (ඇ) ඡේදය යටතේ දායක වීමට ශ්‍රී ලංකාවට හිමිකම් ඇති, ඒ වැඩි කරන ලද ප්‍රාග්ධන ස්කන්ධයේ අනුපාතයට දායක වීමට ශ්‍රී ලංකාව තීරණය කරන්නා වූ ද අවස්ථාවක, සංස්ථාව විසින් ඉහත කී (ඇ) ඡේදය යටතේ තීරණය කරනු ලබන කොන්දේසිවලට අනුකූලව, ඒ දායක මුදල ගෙවීම සඳහා අවශ්‍ය වන මුදල, ශ්‍රී ලංකාවේ ඒකාබද්ධ අරමුදලින් ගෙවනු ලැබිය යුතු ය.".

ජ 35486 – 11,485 (78/07)